පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නාට්‍ය හා රංගකලාව- I - කොටස

පාසලේ නම : ......................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ........................................

........................................ කාලය : පැය 1 යි.

❖ **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

පහත දැක්වෙන කවි, සිංදු, ගීත, ආශ්‍රයෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - රතදර සිරියා පරදන - රූපෙට වටිනා නිමල කොමල තරුණී
අයියෝ මාගේ යෞවන කාලේ - මෙහෙමද පසුවන්නේ

B - හෙළ ගැඹුරුයි පුත නොබලන්
සෙලවෙන කොට වැල් පාලම
දෑස පියන් බිම නොබලන්
දෑස පියන් බිම නොබලන්

C - නන්සිරින් වොරැදි බරණැස්පුරයේ
තෙද යුත් උතුම් - හූ පාලනා මා පිය වේ.

D - වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙව්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි කියන්නේ

E - මව්පියො නිදහස් වෙන්නටා
මාව දුන්නයි නාකි වූ හාමෙකුටා
උන්දැල හට කඹුරන්නටා
යැද ඉන්නේ සුරන්හට දෙස්කොටා

01. ශ්‍රී ලංකාවේ පැරණිම ගැමි නාටකයට අයත් කවිය වන්නේ,
i. A ii. B iii. C iv. D

02. කෝලම් චරිතයක් විසින් ගැයෙන කවියක් වන්නේ,
i. A ii. B iii. D iv.E

03. පරිවර්තන නාට්‍යක ඇතුළත් ගීතයකි,
i. A ii. B iii. C iv. D

04. ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ හැරවුම් ලක්ෂය සනිටුහන් කරන නාට්‍ය ඇතුළත් ගීතයකි.
i. A ii. B iii. C iv. D

05. A අක්ෂරයෙන් දැක්වෙන නාට්‍ය ගීතය අයත් නාට්‍ය වන්නේ
i. දික්තල කාලගෝල ii. සිංහබාහු iii. බෙරහඬ iv. රත්තරං

06. ශ්‍රව්‍යදෘශ්‍ය කලාවන් ඇතුළත් වරණය තෝරන්න.
i. චිත්‍ර, මූර්ති,බැලේ,ඔපෙරා ii. නාට්‍ය,බැලේ,ඔපෙරා.චිත්‍රපට
iii. කාටූන්,චිත්‍රපට,චිත්‍ර,නාට්‍ය iv. මූර්ති,නාට්‍ය,චිත්‍රපට,නර්තනය

07. පුද්ගලයාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරනු ලබන චලන රටාවකි.
i. ස්වභාවික චලන ii. තාලානුකූල චලන
iii. රිද්මයානුකූල චලන iv. නිර්මිත චලන

Education NCP- www.edncp.lk

08.




ඉහත රූපයෙන් දක්වෙන්නේ.

i. නාට්‍ය ජවනිකාවකි

ii. රංග ක්‍රීඩාවකි

iii. රංග අභ්‍යාසයකි

iv. වේදිකා සැලසුමකි

09. කිසියම් චරිතයක් , සිදුවීමක් , අවස්ථාවක් නිර්මාණාත්මක ලෙස නිරූපණයේ යෙදීමේදී

i. අන්‍ය අදහස් හා යෝජනා විමසීම වැදගත් නොවේ.

ii. සාමූහිකව නිරූපණය අනිවාර්ය වේ.

iii. නිරීක්ෂණය හා අත්දැකීම් ලබා තිබීම වැදගත් නොවේ.

iv . නිර්මාණශීලි චින්තනය හා පරිකල්පනය වැදගත් වේ

10. ඔබ නෙළුම් ඇටයක් යයි සිතා , නෙළුම් ඇටයක් පැළ වී, මතු වී මලක් බවට පත්වී නැවත එහි පෙති හැලී පරවී යාම නිරූපණය කරන රංග අභ්‍යාසය කුමක්ද?

i. සංවේදන අභ්‍යාස

ii. ශිථිලකරණ අභ්‍යාස

iii. චිත්තඒකාග්‍රතාවය ඇති කරන අභ්‍යාස

iv. ශ්වසන අභ්‍යාස

- 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු ලියන්න.

| ක | ග | ජ | ඩ |
|---|---|---|---|
| නානු මුරය | මහාකෝල සන්නි යකා | බමුණා | දේව දූතයා |
| රිද්දි බිසව | සූනියම් යක්ෂණිය | මැණික්පාල බිසව | ගදුභ |
| කපු නෙළීම | බිහිරි සන්නිය | වසවර්ති මාරයා | මිලිඳු රජු |
| දීපංකර බුදුන් | අසුපාලි බිසව | වඩිග දේශය | නාගසේන ස්ථවිර |

11. ඉහත වගුවේ 'ග' කොටුවේ ඇතුළත් අංග අයත් වන්නේ

i. උඩරට ශාන්තිකර්මයකටය

ii. පහතරට ශාන්තිකර්මයකටය

iii. සබරගමු ශාන්තිකර්මයකටය

iv. ගම්මඩු ශාන්තිකර්මයකටය

12. කාන්තාවන් සඳහාම වෙන්වූ ශාන්තිකර්මයට අයත් අංග ඇතුළත් වන්නේ,

i. ක

ii. ග

iii. ජ

iv. ඩ

13. නාට්‍යමය ජවනිකා එකක් පමණක් වූ ශාන්තිකර්මය අයත් අක්ෂර වන්නේ

i. ක

ii. ග

iii. ජ

iv. ඩ

14. ඉහත 'ඩ' අක්ෂරයෙන් දැක්වෙන චරිත ඇතුළත් වන්නේ

i. ශාන්තිකර්මයකටය

ii. ගැමි නාටකයකටය

iii. බෞද්ධ පූජාකර්ම යකට ය.

iv. රූකඩ නාටක යකට ය.

15. බහුල ලෙස වෙස්මුහුණු භාවිතා කරන ශාන්තිකර්මයට අයත් වන්නේ

i. ක

ii. ග

iii. ජ

iv. ඩ

Education NCP - www.edncp.lk

● 16 සිට  20 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරින් පිළිතුරු ලියන්න.

A



B



C



D



16.  ' A ' ජායාරූපයෙන් දැක්වෙන නිළිය රඟපෑ නාට්‍යයකි.

i. ලෝමහංස  ii. ගජමන් පුවත
iii. කුවේණි  iv. රතු හැට්ටකාරී

17. 1978 'ජේ මයර්' නම් නාට්‍යකරුවාගේ වැඩමුළුවක් තුළින් නාට්‍ය ක්ෂේතයට පිවිසි නළුවා වන්නේ.

i. A  ii. B  iii. C  iv. D

18. 'හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්' යන ගීතය ඇතුළත් නාට්‍ය නිෂ්පාදනය කළ නාට්‍යකරුවා වන්නේ

i. A  ii. B  iii. C  iv. D

19. 'දෙයක් වේ නම් යම් සුද්සුසාටම අයිති විය යුතුය' යන්න තේමා කරගත් විශිෂ්ට නාට්‍ය නිෂ්පාදනය කළ ශිල්පියා වන්නේ

i. A  ii. B  iii. C  iv. D

20. වර්තමාන වේදිකාවේ , සිනමාවේ , රූපවාහිනී නාට්‍ය කලාවේ දක්ෂතා ප්‍රකට කරන ශිල්පියා වන්නේ

i. A  ii. B  iii. C  iv. D

21. අංගරචනය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න

i. අඳුර හා එළිය පිළිබඳ මූලධර්මය අංගරචනයේ දී වැදගත් නොවේ.
ii. අංගරචනයේදී රංග සම්ප්‍රධාය වැදගත් නොවේ
iii. අංගරචනයේ දී පුද්ගලයාගේ මුහුණ පමණක් හැඩගන්වනු ලැබේ.
iv. මුහුණේ ත්‍රිමාණ ගතිය මතුකර ගැනීම සඳහා  වර්ණ භාවිතා කරනු ලැබේ.

22. නාට්‍ය ගීතයක් ගායනා කළ යුතු ආකාරය නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

i. නිවැරදි උච්චාරණය හා හඬ පාලනය පමණක් සැලකිල්ලට ගත යුතුය.
ii. චරිතයට උචිත වීම, භාව ප්‍රකාශනයෙන් යුක්තව, තාලය ,යතිය, පිහිටුවා ගායනා කළ යුතුය.
iii. හඬ පාලනය, මාධූර්ය, ලය පිළිබඳ පමණක් සැලකිය යුතුය.
iv. නිවැරදි උච්චාරණය, හඬ පාලනය සහ ලය පිළිබඳ පමණක් සැලකිය යුතුය.

23. දිත්තල කාලගෝල නාට්‍යය අවසන් වන්නේ,

i. පූර්ණ විරිඳුවකිනි  ii. පොතේ ඉන්නිසයෙහි.
iii. මංගලම් සිංදුවකිනි  iv. බහුබූත කෝලමෙනි

24. අතීතයේ ගැමි ජනයා සීසාන විට නගන අඬහැරය අයත් අභ්‍යාසය වන්නේ

i. ශ්වසන අභ්‍යාස  ii. සංවේදන අභ්‍යාසය
iii. ශිථිලකරණ අභ්‍යාස  iv. ස්වර අභ්‍යාස

25. ඓතිහාසික චරිත , සිදුවීම් පාදක කරගනිමින් නිර්මාණය වූ නාට්‍යය 02 කි,

i. ඇන්ටිගනි සහ පවරනුවර  ii. තාරාවෝ ඉගිලෙති සහ පුන්තිලා
iii. සුබ සහ යස සහ දෝන කතරිනා  iv. මහ සමයම සහ මඟුල් ප්‍රස්ථාව

Education NCP - www.edncp.lk

● පහත වගුව ඇසුරින් අංක 26 සිට 29 දක්වා පිළිතුරු ලියන්න.

| මුල් කෘතිය | රචකයාගේ නම | පරිවර්තිත කෘතියේ නම | පරිවර්තකයා |
|---|---|---|---|
| ද කැට් ඔන් අ හොට් ටින් රූෆ් | ටෙනිස් විලියම් | E | සුගතපාල ද සිල්වා |
| F | ඇල්බෙයා කැමූ | විනිශ්චය | පරාක්‍රම නිරිඇල්ල |
| මදර් කරේජ් | G | දිරිය මව සහ ඇගේ දරුවෝ | හෙන්රි ජයසේන |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල් බ්‍රෙෂ්ට් | හිත හොඳ අම්මණ්ඩි | H |

26. ඉහත E කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තිත නාට්‍යයේ නම කුමක්ද ?

i. හරිම බඩුහයක් ii. හෙලේ නැංග ඩෝන්පුතා

iii. හිත හොඳ අම්මණ්ඩි iv. ඇසළ සඳ කළුවර

27. ඉහත වගුවේ F කොටුවට ඇතුළත් විය යුතු විදේශීය මුල් නාට්‍ය කෘතියේ නම කුමක්ද?

i. ද ඩ්‍රැගන් ii. ද හෝර්ස්

iii. ද වෙඩින් iv. ද ජස්ට්

28. ඉහත වගුවේ G කොටුවට ඇතුළත් විය යුතු විදේශීය නාට්‍ය කරුවාගේ නම කුමක්ද?

i. බර්ටෝල් බ්‍රෙෂ්ට් ii. ඔස්කා වයිල්ඩ්

iii. ෂෙරිඩන් iv. ඇරිස්ටොෆානිස්

29. ඉහත වගුවේ H කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තකයාගේ නම කුමක්ද?

i. බන්ධුල ජයවර්ධන ii. පරාක්‍රම නිරිඇල්ල

iii. සයිමන් නවගත්තේගම iv. සුගතපාලද සිල්වා

30. ශ්‍රී ලාංකික නාට්‍ය කලාවට ලෝක ධර්මී නාට්‍ය නිෂ්පාදනය හඳුන්වා දුන් ප්‍රමුඛතම නාට්‍යකරුවා වන්නේ

i. හෙන්රි ජයසේන ii. සුගතපාලද සිල්වා

iii. ආර්.ආර්. සමරකෝන් iv.සයිමන් නවගත්තේගම

● 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පහත සංවාද ඛණ්ඩ ඇසුරින් පිළිතුරු සපයන්න.

a. හොඳටම තෙමා ගත්ත නේද මයිකල්?

b. එසේය... අවසර මහ රජතුමනි, වන්දිභට්ටයින්ගේ ගායනා මහා සම්මත කාලයේ හිටන් ඉටු කරන්නා වූ චාරිත්‍රයකි

c. තව පොඩ්ඩකින් මම බොහොම වැදගත් දෙයක් කියනවා කවුද මේ ජනේලය වැහුවේ

d. දෙමව්පියන් දූ දරුවන් - නාමෙට පිං පමුණුවන්න
මළගිය ඇත්තන් වෙනුවෙන්- පිනට මොකුත් මට ලැබෙන්න

e. පයින් අවිදිල්ල - මහන්සිද මන්දා
ගොඩින් පැනගත්තා- හුගක් ළග හින්දා

31. ඉහත සංවාද ඛණ්ඩය ඇතුරින් නාට්‍යධර්මී ලක්ෂණ පෙන්නුම් කරන්නේ,

i. a හා b ය ii. c හා d ය

iii. d හා e ය iv. c හා d ය

32. ඉහත සංවාද අතරින් ලෝක ධර්මී ලක්ෂණ පෙන්නුම් කරන්නේ

i. a, b හා c ii. b, c හා d

iii. c, d හා e iv. a, c හා d

33. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණකට අයත් ගිත ඛණ්ඩය වන්නේ,

i. a ii. b

iii. c iv. d

34. විදේශීය පරිවර්තන නාට්‍යකට අයත් සංවාද ඛණ්ඩය වන්නේ,

i. a ii. b

iii. c iv. d

Education NCP - www.edncp.lk

35. ජනකතා ආශ්‍රය කරගනිමින් නිර්මාණය වූ නාට්‍යය දෙකට අදාළ සංවාද ඛණ්ඩය වන්නේ,

i. a හා b
ii. b හා c
iii. c හා d
iv. d හා e

36 . සමාරෝපය යන්නට වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න

i. මුහුණේ හැඟීම්වලින් චරිතය ප්‍රකාශ කිරීම
ii. චරිතයට අදාළව වචන ප්‍රකාශ කිරීම
iii. අභිනය භාවිතා කිරීමෙන් චරිතයට ආරෝපණය වීම
iv. පරිකල්පනයෙන් මවා ගන්නා චරිතය කර පෙන්වීම

37. මනස මූලික කරගනිමින් හටගන්නා භාවයන් ප්‍රකට කරවීම සඳහා උපකාරීවන අභිනය කුමක්ද?

i. ආංගික අභිනය
ii. වාචික අභිනය
iii. සාත්වික අභිනය
iv. ආහාර්ය අභිනය

38. "ගැටුම" යන්නට වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. චරිත අතර පමණක් ගැටුම ඇතිවේ
ii. ගැටුම ඇතිවන්නේ චරිත අතර ප්‍රතිවිරුද්ධ අදහස් මතුවීමෙනි
iii. ගැටුම ප්‍රධාන වශයෙන් ප්‍රභේද තුනකට බෙදෙයි
iv. ගැටුමක් නොමැතිව වුවද නාට්‍යක් ඉදිරිපත් කළ හැකිය

39. භූමිකාවක් යනු

i. නාට්‍යක චරිතයකි
ii. රංග භූමියයි
iii. චරිතයක් රඟදක්වීමයි
iv. චරිතයක පැතිකඩයි

40. නාට්‍යයක් රඟ දක්වෙන මොහොතේදී එහි සාර්ථකත්වයට අනිවාර්යයෙන්ම සිටිය යුත්තේ

i. ප්‍රේක්ෂකයා.
ii. නාට්‍ය පෙළ රචකයා.
iii. නාට්‍ය ශාලාව භාරකරුවා.
iv. නාට්‍ය සංවිධායකවරයා.

(ලකුණු 1×40)

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# දෙවන වාර පරීක්ෂණය - 2019

## නාට්‍ය හා රංගකලාව- II - කොටස

පාසලේ නම : ......................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ............................................................

............................................................ කාලය : පැය 2 යි.

- පහත සඳහන් ප්‍රශ්න අතරින් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. දික්තල කාලගෝල නාට්‍ය දෙවන වරට නිෂ්පාදනය කළ වර්ෂය කුමක්ද? (ලකුණු 02)

ii. එම දෙවන නිෂ්පාදනයේ දී සංගීත අධ්‍යක්ෂණය කළේ කවුද? (ලකුණු 02)

iii. 'ගතද කඩමලු වැරහැලි ඇඳ ඔතා - පිසස් රළු ගතියෙනා' යනුවෙන් පොතේගුරු වේදිකාවට කැඳවන චරිතය කුමක්ද? (ලකුණු 02)

iv. දික්තල- කාලගෝල නාට්‍යයේ සංවාදවල ඔබ දකින ලක්ෂණ 02 ක් ලියන්න (ලකුණු 02)

v. දික්පිටියා දික්තලා ලබා ගැනීම සඳහා කාලගෝලට දෙනවා යැයි පවසන්නේ මොනවාද? (ලකුණු 02)

vi. දික්තලා නාට්‍ය අවසානයේදි ගත් තීරණය පිළිබඳ කරුණු 02 කින් ඔබේ අදහස දක්වන්න (ලකුණු 02)

02. i. නෘත්ත හා නෘත්‍ය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. නෘත්‍ය හා නාට්‍යයේ සමාන හා අසමානතා දෙක බැගින් ලියන්න . (ලකුණු 04)

iii. නාට්‍යයේ සුවිශේෂී ලක්ෂණ කරුණු 03 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

03. i. ඔබ ඉගෙන ගත් රංග අභ්‍යාස 2ක් නම් කර ඊට අදාළ ක්‍රියාකාරකම් 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. රංග අභ්‍යාසවල නිරතවීමෙන් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන 04ක් ලියන්න . (ලකුණු 04)

iii. ඔබ පංතිකාමරයේ සිදු කරන රංග අභ්‍යාස එදිනෙදා ජීවිතය සාර්ථක කරගැනීමේදී ඉවහල්වන ආකාරය කරුණු 03 ඇසුරින් ලියන්න. (ලකුණු 06)

04. i. ශ්‍රී ලංකාවේ නාට්‍යකලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 02)

ii. එම නාට්‍යකරුවන් දෙදෙනා විසින් නිෂ්පාදිත ස්වතන්ත්‍ර නාට්‍ය දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

iii. ලංකාවේ නාට්‍යකලාවේ රංගභූමි භාවිතය නව මඟකට යොමුකල නාට්‍යකරුවා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 06)

05. i. රූපණය කාලයක් තිස්සේ පුහුණු විය යුත්තකි. රූපන කාර්යයේදී නළුවෙකු චරිතයකට ප්‍රවේශ වන ආකාර දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. රූපණ කාර්යයේ දී නළුවකු විසින් අවධානය යොමුකල යුතු කරුණු 04 ලියන්න. (ලකුණු 04)

iii. ඔබට චරිතයක් රූපණය කිරීමට අවස්ථාව ලැබුණොත් එය සිදුකිරීමේදි සූදානම් වන ආකාරය පියවර වශයෙන් ලියන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk

06. i. අංගරචනයෙහි ප්‍රධාන ප්‍රභේද 02ක් නම් කරන්න. (ලකුණු 02)

ii. අංගරචනා ද්‍රව්‍ය 4ක් නම් කර එයින් කෙරෙන කාර්යය සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ඔබට සත්ත්ව චරිතයක් අංගරචනය කිරීමට සිදුවුව හොත් එය සිදුකරන ආකාරය පියවර වශයෙන් ලියන්න. (ලකුණු 06)

07. i. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවන් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න.

' සහන්, ළහිරු , කමල් , උදෑසනම පාසල වෙත යෑමට පිටත් වෙයි. නමුත් එදින ඔවුන්ගේ පාසල් බස් රථය පැමිණියේ නැත. ඉගෙනීම කෙරෙහි දැඩි උනන්දුවක් දක් වූ ඔවුහු පයින්ම පාසල වෙත යාමට තීරණය කළහ. ඒ සඳහා ඔවුන් තෝරා ගත්තේ කැළෑ රොදක් මැදින් වැටුණු කෙටි පාරකි..............'

i. නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම සඳහා (ලකුණු 04)

ii. රංගවිධාන , සංවාද සහිතව රචනා කිරීම සඳහා (ලකුණු 08)

Education NCP - www.edncp.lk

PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
(අ.පො.ස. සා.පෙළ)
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
(අ.පො.ස. සා.පෙළ)
සිංහල
G.C.E. O/L SINHALA
A/L
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440